**ශීර්ෂය** 118 **- කෘෂිකර්ම අමාත්‍යාංශය**

**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

1.1 **විගණන මතය**

**----------------**

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ **2018** දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය**,** එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත **2018** දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව සහ විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර**,** මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම**,** විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්**,** වියදම්**,** වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.
වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.
අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම**

(අ) 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/18 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ ප්‍රකාරව සටහන් අංක (iii) යටතේ වන බැදීම් හා බැරකම් ප්‍රකාශය භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශය සමඟ එකඟ විය යුතු වුවත් වැය විෂයයන් 46 ක භාණ්ඩාගාර බැදීම් හා බැරකම් ප්‍රකාශයට වඩා එකතුව රු.11,646,088,159 ක් වූ බැරකම් වැඩියෙන්ද වැය විෂයයන් 07 ක එකතුව රු.60,039,001 ක් වූ බැරකම් අඩුවෙන්ද දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | **2019** ජනවාරි මුල් සතියෙන් පසුව හඳුනාගන්නා බැරකම් භාණ්ඩාගාරයට වාර්තා කළ නොහැකි වීම සහ වෙනත් දෙපාර්තමේන්තුවල දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල බැරකම් හා භාණ්ඩාගාරයට වාර්තාවන බැරකම් අතර වෙනස්කම් තිබිය හැකිය. |

**1.6.2. බැදීම් හා බැරකම්**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාල එකතුව රු.744,166 ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | සියලුම බැරකම් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. | උපදෙස් ලබාදුන් පරිදි නියමිත දිනයන්හිදී එම අංශවලින් ඉදිරිපත් නොවුණු හෙයින් ගිණුමේ ඇතුළත් කිරීමට නොහැකි වී ඇත. |
| (ආ) | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා බැදීම් හා බැරකම්වලට නොඑළඹිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති ඉතිරිය ඉක්මවා වැය විෂයයන් 24 ක් සඳහා එකතුව රු.29,272,839 ක් වූ බැරකම්වලට එළඹී තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය | -එම- |

| | | |
|---|---|---|
| (ඇ) පොහොර සහනාධාර වැය විෂයෙහි සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.1,449,889,412 ක් වූ ඉතිරිය ඉක්මවා රු.8,390,327,962 ක බැරකම්වලට බැඳී තිබුණි. එම බැරකම් තුල පොහොර සහනාධාර ලෙස ගෙවිය යුතු තුන්වන හා හතරවන කාර්තුවල බැරකම් නිශ්චිතව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | -එම- | -එම- |

**1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොගැනීම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **බැරකම් ලේඛණය** | | |
| අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. | බැරකම් ලේඛන සකස් කරමින් පවති. |

**1.6.4 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පියවීම් පිළිබඳ ප්‍රකාශය**

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත පරිදි විය.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) සේවය හැර ගිය හා වැඩ තහනමට ලක් වූ සේවකයන්ගෙන් පිළිවෙලින් අයවිය යුතු රු.268,061 ක් හා රු.240,267 ක් අය කරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.6 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුයි. | ණය ගොණු හෝ පුද්ගලික ලිපි ගොනු නොමැති වීම නිසා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටද නොහැකි වී ඇත. ණය ශේෂය අයකර ගැනීමට තවදුරටත් කටයුතු කරමින් පවතී. සමහර ණය ශේෂ කපා හැරීම සඳහා භාණ්ඩාගාරයෙන් ඉල්ලීම් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විශ්‍රාම ගිය සහ මිය ගිය නිලධාරින් දෙදෙනෙකුගේ රු.222,625 ක ආපදා ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.2.5 සහ 4.4 ඡේදයන් ප්‍රකාරව අයවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | විශ්‍රාම වැටුප් සැකසීම සිදු නොවීම හේතුවෙන් මෙම ණය ශේෂ මෙතෙක් නිරවුල් කර ගත නොහැකි වී ඇත. |
| (ඇ) | ආපදා ණය සහ දේපල ණය ලබා ගැනීමේදී අවලංගු කළ නොහැකි පොරොන්දුවකට නිලධාරියා අත්සන් කළ යුතු වුවත් ඒ පරිදි කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.3 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී ඒ අනුව කටයුතු කිරීමට සටහන් කර ගතිමි |

## 1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | | නිරීක්ෂණය<br>වටිනාකම<br>රු. | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (අ) | අංක බීඩී/සීබීඩී/4/1/23-2015 දරන 2015 මාර්තු 31 දිනැති මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය | 796,208 | චක්‍රලේඛ විධිවිධනවලට පටහැනිව කහන්තේවෙල කෘෂි ගම්මාන ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනේ ප්‍රචාරන කටයුතු සඳහා පුවත්පත්වල ලිපි පලකිරීමට රු.796,208 ක් වැයකර තිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මහජනතාව දැනුවත් කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන පුවත්පත් මගින් ප්‍රචාරණ කටයුතු සිදු කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | 2015 මැයි 20 දිනැති අංක 11/2015 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි 06 ඡේදය | 1,470,223 | චක්‍රලේඛය ප්‍රකාරව රාජකාරී උත්සව පැවැත්වීම සීමා කිරීම හා වියදම අවම වන සේ උත්සව සංවිධානය කිරීමට කටයුතු කළ යුතු වුවත් කහන්තේවෙල කෘෂි ගම්මාන ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනේ සමාරම්භක උත්සවය සඳහා රු.1,470,223 ක මුදලක් වැය කර තිබුණි. | -එම- | -එම- |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාග්ධන වැය විෂයයන් 05 ක සහ පුනරාවර්තන වැය විෂයයන් 03 කට අදාලව රු.28,530,000 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු සකස් කළ යුතුය. | කිහිප අවස්ථාවකම අමාත්‍ය ධූර මාරුවීම, ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු විය. |
| (ආ) | වැය විෂයයන් 06 සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන රු.642,264,809 ක් සලසාගෙන තිබුණද, එම සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු සකස් කළ යුතුය. | 2018 ඔක්තෝබර් 26 දින ඇතිවූ අමාත්‍ය මණ්ඩල සංශෝධනය මත ප්‍රතිපාදන උපයෝජනය අඩු වීම, වර්ෂ අවසානයේ ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම, වර්ෂය තුළ පැවති අයහපත් කාලගුණ තත්වය නිසා යෝජිතව තිබූ ඇතැම් ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීම, ඉතිරි වීම් වලට හේතු විය. |

**3 මෙහෙයුම් සමාලෝචනය.**

**3.1 සැලැසුම් කිරිම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබූ නමුත්, එහි වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ඇතුලත් වී නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2019 වර්ෂයේ සිට ප්‍රසම්පාදන සැලැස්ම ඇතුලත් කිරීමට කටුයුතු කරනු ඇත. |

**3.2 ප්‍රසම්පාදනයන්**

**පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **අමාත්‍යාංශය සඳහා බදු පදනම මත කාර්යාල ගොඩනැගිල්ලක් ලබා ගැනීම** | | |
| (අ) ගොඩනැඟිල්ල ඉදි කිරීමට අදාළ අනුමත සැලැස්ම අනුව මහල් 07 ක් වුවද මහල් 09 ක් ඉදි කර තිබුණි. ගොඩනැඟිල්ල කුලියට ගැනීමේදි ඒ පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි. | පවත්නා නීතිරීති හා මුදල් රෙගුලාසිවලට අනුව කටයුතු කල යුතුය. | නාගරික සංවර්ධන අධිකාරියේ සහතික ලබා ගැනීම ගොඩනැගිලි හිමිකරුට අයත් කාර්යයකි. |
| (ආ) රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුවට අනුව ගොඩනැගිල්ලේ වෙළඳපළ කුලිය මාසිකව රු.මිලියන 13.5 ක් වුවද එය ඉක්මවා රු. මිලියන 21 ක කුලියක් ගෙවීමට එකඟ වී තිබුණි. | -එම- | අග්‍රාමාත්‍ය කාර්යාලය මගින් ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාව මගින් කොන්දේසි තීරණය කර තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මුදල් රෙගුලාසි 835(2) (ඉ) සහ 03 වගන්තිවලට අනුව බදු කාලසීමාව උපරිම වර්ෂ 03 ක් විය යුතු වුවද එය අවුරුදු 05 ක කාලසීමාවක් දක්වා ලබාගෙන තිබූ අතර වසර 03 න් පසු බදු කුලිය සියයට 15 ක් ලෙස වැඩි කිරීමට එකඟ වී තිබුණි. එමෙන්ම වසර 02 ක බදු කුලිය වූ රු.මිලියන 504 ක මුදල එකවර ගෙවීම හා තුන්වන හතරවන වර්ෂවලදී හිලව් කිරීමට වූ කොන්දේසි පිළිගෙන තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට සහ චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව රජයට උපරිම වාසි ලැබෙන අයුරින් කටයුතු කළ යුතුය. | කැබිනට් අනුමැතිය හා ගිවිසුම අනුව එකඟ වී ඇති කොන්දේසි යටතේ කටයුතු කර ඇත |
| (ඈ) | ගොඩනැඟිල්ල භාවිතයට ගෙන නොතිබුණු 2016 අප්‍රේල් සිට 2017 ජුලි මස දක්වා කාලයට කුලී හා බදු මුදල් ලෙස රු.275,211,000 ක් හා සේවා ගාස්තු ලෙස රු.90,000,000 ක් ගෙවා තිබුණි. එමෙන්ම ගොඩනැඟිල්ල කුලියට ගැනීමේදි වාහන නවතා තැබීමේ පහසුකම් පිලිබඳව අවධානය යොමු කර නොතිබුණි. මීට අමතරව ගොඩනැඟිල්ල කාර්යාලයක් ලෙස පවත්වා ගෙන යැමට හා උපකරණ ලබා ගැනීමට රු. 260,845,487 වැය කර තිබුණි. | -එම- | -එම- |

**3.3 කළමනාකරණ දූර්වලතා**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| විගණන නිරික්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | **ජාතික පොහොර ලේකම් කාර්යාලය** | | |
| **i.** | ආනයනය කරනු ලබන පොහොර වල තත්ත්ව සහතික කිරීමේ පරීක්ෂාවන් ශ්‍රි ලංකා ප්‍රමිති ආයතනයේ විද්‍යාගාරයෙන් හෝ කාර්මික තාක්ෂණ ආයතනයේ විද්‍යාගාරයෙන් පමණක් ලබා ගත යුතු වුවත් නියැදි සාම්පල් පුද්ගලික විද්‍යාගාර 04 කින් සිදු කර ගෙන තිබුණි. | අනුමත කර ඇති ආයතන වලින් ලබා ගැනීමට කටයුතු කල යුතුය. | 1988 අංක 68 දරන පොහොර විධිමත් කිරීමේ පනතේ 12(1)(ඇ) වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂවරයා වෙත පැවරී ඇති බලතල අනුව අදාල කටයුතු සිදු කිරීමේ හැකියාව පවතී. |

| | | | |
|---|---|---|---|
| **ii.** | කැබිනට් පත්‍රිකාව පරිදි අනෙකුත් භෝග වගාවන් සඳහා පොහොර ආනයනය සඳහා එක් එක් සමාගම වෙත පොහොර සහනාධාර සලාක ලබා දීම සඳහා කමිටුවක් පත්කළ යුතු බව දක්වා ඇතත් එවැනි කමිටුවක් පත්කර නොතිබුණි. | කැබිනට් පත්‍රිකාව ප්‍රකාරව කටයුතු කළ යුතුය. | කමිටුව පත් කිරීම සඳහා අදාල කමිටු සාමාජිකයින් දැනුවත් කර ඇත. ශ්‍රී ලංකාවට සෘජු රසායනික පොහොර ආනයනය කරනු ලබන පෞද්ගලික පොහොර සමාගම් වෙත පමණක් සහනාධාර පොහොර සලාක ලබා දී ඇත. |
| **iii.** | සහනාධාර මුදල් ගෙවීමේදී අමාත්‍යාංශය විසින් පරිගණක දත්ත පද්ධතිය ආරම්භ කර තිබුණු අතර එය වැඩිදියුණු කිරීමට රුපියල් 800,000 ක් වැය කර තිබුණ ද පොහොර සහනාධාරය ගෙවීමේදී අඩුපාඩු සිදුවී තිබුණි. එම පද්ධතියේ අඩුපාඩු සකස් කරගැනීමට කටයුතු කර නොතිබුණි. | පවත්නා පද්ධතියට අනුකූලව සහ ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | දත්ත පද්ධතිය නිර්මාණය කරන ලද කොළඹ විශ්ව විද්‍යාලයෙන් සේවා ගාස්තු ලෙස රු.800,000 ක් ඉල්ලා තිබූ බැවින් අධ්‍යක්ෂවරයාගේ ඉල්ලීම මත අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත අදාල කටයුතු සිදු කර ඇත. |
| **iv.** | පොහොර වල තත්ව සහතික කිරීම සඳහා අදාල පොහොර තොගවල නියැදි ලබා ගැනීමේදී පොහොර ලේකම් කාර්යාලය විසින් යොදවනු ලබන නිලධාරින්ට අමතරව අභ්‍යන්තර විගණන ඒකකයේ නිලධාරින් යෙදවීම තුලින් එම කටයුතු විනිවිධභාවයකින් සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පවත්නා පද්ධතිය වැඩි දියුණු කළ යුතුය | ඉදිරියේදී මේ සම්බන්ධව කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත. |
| **v.** | පොහොර ආනයනය කිරීමේදී රාජ්‍ය සහ පෞද්ගලික සමාගම් වෙත දෙනු ලබන සහනාධාර මුදල් ගෙවීම් කිරීමේදී විශාල මූල්‍ය වටිනාකමක් සහිත ගෙවීම් සිදු වන බැවින් එහි අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා විධිමත් පරිදි කාර්ය බෙදීමක් හා ගණකාධිකාරී තනතුර පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුව පැවතුණි. | පවත්නා පද්ධතිය වැඩි දියුණු කළ යුතුය | ඉදිරියේදී මේ සම්බන්ධව කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත. |
| **(ආ)** | ලෝක බැංකුවේ ණය ආධාර මත ක්‍රියාත්මක කරනු ලබන කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය සංවිධානය කර තිබූ ඊශ්‍රායල් | අනුමත කල ආකාරයට කටයුතු කර අධ්‍යන | අදාල අධ්‍යයන චාරිකාව සඳහා එවකට සිටි කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් සහ ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලැබ් ඇති බවත් අදාල නිලධාරිනිය පත් වීම් |

| | | | |
|---|---|---|---|
| | අධ්‍යන චාරිකාව සඳහා අනුමත කරන ලද නිලධාරින් සංඛ්‍යාව 16 ක් වුවද නිලධාරීන් සංඛ්‍යාව 17 ක් ලෙස දක්වා මූල්‍ය කළමණාකාරිනිය ද ඊට ඇතුලත් කර තිබුණි. 2018 අගෝස්තු මාසයේදී ව්‍යාපෘති අරමුදලින් රු.1,075,918 ක මුදලක් සංචාරය සඳහා වැයකර තිබුණද, 2018 සැප්තැම්බර් 30 දින අදාල නිලධාරිනිය ව්‍යාපෘතියෙන් ඉවත්ව ගොස් තිබුණි. | කටුයුතු ලැබීමෙන් පසුව ව්‍යාපෘතියට සේවය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | ලිපියේ කොන්දේසි ප්‍රකාරව ලිත් මාසයක දැනුම් දීමකින් අනතුරුව සේවයෙන් ඉල්ලා අස් වී ඇත. |
| **(ඇ)** | **කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය**<br>------------------------------- | | |
| **i.** | ව්‍යාපෘතියේ තොරතුරු ඇතුළත් කරමින් වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සඳහා කොන්ත්‍රාත් සමාගමකට රු.480,000 ක් ගෙවා තිබුනද ව්‍යාපෘතියේ කටයුතු කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රයෝජනයට ගැනීමට හැකි වන පරිදි යාවත්කාලීන දත්ත එහි ඇතුලත් කර නොතිබුණි. | වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය. | මෙම විගණන නිරීක්ෂණය සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමු වී ඇති බවත් එය යාවත්කාලීන කර එළදායී ලෙස භාවිතයට ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට අදහස් කරමි. |
| **ii.** | 2016 ජුනි 06 දිනැති ව්‍යාපෘති ඇගයීම් වාර්තාවේ 34 වන වගන්තිය අනුව Agriculture Technology Demonstration Park ඇති කිරීමට උපදෙස් ලබාගැනීම සඳහා International Service Provider සඳහා ආයතනයක් තෝරා ගැනීමට නියමිතව තිබුණ ද එසේ සිදුකිරීමට ප්‍රමාද වීම මත එම සංරචක වලට අදාල කාර්යයන් දේශිය වශයෙන් තෝරා ගන්නා ලද උපදේශන ආයතන මගින් ඉටු කරවාගෙන රු.840,187,484ක් ගෙවා තිබුණි. | ව්‍යාපෘති ඇගයීම් වාර්තා සහ උපදෙස් වලට සහ අරමුණුවලට අනුකූලව කටයුතු කළ යුතුය | ප්‍රසම්පාදන කටයුතු සිදු කර ගිවිසුම් ගත වීම සඳහා සාකච්ඡා 2019 ජුනි 11 දින ආරම්භ කෙරුණු අතර ඒ අනුව ගිවිසුම පරිදි ක්‍රියාකිරීම සඳහා ලෝක බැංකුවේ එකඟතාවය සහ ආමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන 2019 අගෝස්තු මාසය වන විට ආරම්භ කිරීමට අපේක්ෂා කරමි. |
| **iii.** | ව්‍යාපෘතියේ කටයුතු සඳහා බඳවා ගත් නිලධාරීන් එම තනතුරු වල කෙටි කාල සීමාවක් තුල රාජකාරි | චක්‍රලේඛ උපදෙස් වලට සහ | ආරම්භයේ පවතින විශේෂඥ තනතුරුවල සේවය කිරීම සඳහා උපදේශකවරුන්ට පත්කර නොමැති අතර පත්කරන ලද |

| | | | |
|---|---|---|---|
| | කටයුතු ඉටුකර ඉවත්ව ගොස් තිබූ අතර ඒ අනුව එම පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීමකින් තොරව ව්‍යාපෘතියේ සේවය කරන ලද අනෙක් නිලධාරින් විසින් රාජකාරි ආවරණය කර තිබුණි. එය සමස්ථ ව්‍යාපෘතියේ මූල්‍ය හා භෞතික කාර්ය සාධනයට සෘජුවම බලපා තිබුණි. | අරමුණුවලට අනුකූලව කටයුතු කළ යුතුය | උපදේශකවරුන් වෙත වෙනම කාර්යභාරයන් පවරා ඇත. |
| **iv.** | ගොවි පුහුණුව හා ධාරිතා සංවර්ධනය සඳහා උපදේශකවරුන් විසින් සකසන ලද පුහුණු අත්පොත් සහ වැඩපොත් මුද්‍රණය කිරීමට 2018 වර්ෂයේදී රු.28,639,133 ක් වැය කර තිබුණ ද 2018 මැයි 13 දින වන විටත් ගොවීන් සඳහා පුහුණු වැඩසටහන් ආරම්භ කර නොතිබුණි. | පවත්නා පද්ධතියට අනුකූලව කටයුතු කළ යුතුය. | ප්‍රධාන පුහුණුකරුවන් සහ ගොවි පුහුණුකරුවන් සඳහා 2019 පත්වීම් ලබා දෙන ලද අතර අවශ්‍ය පුහුණුවීම් ලබා දෙන ලදී. 2018 දෙසැම්බර් 29 දින පුහුණු අත්පොත් මුද්‍රණය කර ලබාගන්නා ලදී. පුහුණු වීම් ලබා දීමට සැලසුම් කර ඇත. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 21 ක්, තෘතීයික මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 4 ක්, ද්විතික මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 273 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 18 ක් වශයෙන් තනතුරු 316 ක් පුරප්පාඩු පැවතුණද එම තනතුරු පිරවීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව කටයුතු කළ යුතුය | පුරප්පාඩු සඳහා වැඩ බැලීම හා කොන්ත්‍රාත් පදනම මත පත්වීම් ලබා දී ඇති අතර පුරප්පාඩු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ තනතුර 2017 අප්‍රේල් 11 දින සිට පුරප්පාඩුව පැවතුණද පත්වීම් බලධාරියා ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශ අනුව එම තනතුර පිරවීමට 2019 මැයි මස 20 දින දක්වා කටයුතු කර නොතිබුණි. | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | උසස් වීම් පටිපාටිය සකසා අනුමැතිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. එය අනුමත වූ පසු පුරප්පාඩුව පිරවීමට කටයුතු කළ හැක. |